# ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

# ශක්තිමත් ඩිජිටල් ආර්ථිකයකට ඉදිරි පියවරක් තැබීමට සූදානම් ද?

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය (MoDE) උපායමාර්ගික ඩිජිටල් මුල පිරීම් හරහා නවෝත්පාදනය, සංවර්ධන සහ දියුණුව මෙහෙයවමින් ශ්‍රී ලංකාවේ තාක්ෂණික පරිවර්තනයේ ඉදිරියෙන්ම සිටියි. ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය සක්‍රිය කිරීම සඳහා පුළුල් රාමුවක් සැපයීමට ඩිජිටල් ආර්ථික සැලැස්ම ස්ථාපිත කර තිබේ. ඩිජිටල් ආර්ථික සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය (MoDE) විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) ස්ථාපිත කර ඇත. ඩිජිටල් රජය, ඩිජිටල් කර්මාන්ත, ඩිජිටල් ආර්ථිකය, උපායමාර්ගික කර්මාන්ත සහ ධාරිතා වර්ධනය ඇතුළු අවධානය යොමු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා සහය වීම පිණිස කෙටි කාලීන රැකියා කොන්ත්‍රාත්තු සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය කුසලතාපූර්ණ සහ පළපුරුදු වෘත්තීයයින් බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

**මෙය ඔබට අවස්ථාවක් වන්නේ ඇයි ?**

- ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය සක්‍රිය කිරීමේ පරිවර්තනීය මුල පිරීමක කොටස්කරුවෙකු වීමට හැකි වීම
- ඩිජිටල් අවකාශයේ ඉහළ පෙළේ වෘත්තිකයන් සමඟ සහයෝගයෙන් එක්ව කටයුතු කිරීමට ලැබීම.
- ජාතියේ තාක්ෂණික භූ දර්ශනයේ අනාගතය හැඩ ගැන්වීමේදී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කිරීමට ලැබීම

**අප සොයනුයේ කාවද?**

1. ව්‍යාපෘති කළමනාකරු (PM) - තනතුරු 05යි.
2. මෘදුකාංග නිර්මාණ ශිල්පී (Software Architect) - තනතුරු 04යි.
3. Technical Lead - තනතුරු 04යි.
4. ජ්‍යෙෂ්ඨ මෘදුකාංග ඉංජිනේරු - තනතුරු 06යි.
5. ව්‍යාපාර විශ්ලේෂක (BA) - තනතුරු 04යි.
6. පද්ධති නාමාවලි සම්බන්ධීකාරක (System Catalog Coordinator) - තනතුරු 01යි.
7. වත්කම් දත්ත විශ්ලේෂක - තනතුරු 02යි.
8. ඉල්ලීම් ඇතුළත්කර ගැනීමේ සම්බන්ධීකාරක (Request Intake Coordinator) - තනතුරු 01යි.
9. ව්‍යාපෘති සමාලෝචන විශ්ලේෂක - තනතුරු 02යි.
10. යෝජනා ඇගයුම් විශ්ලේෂක - තනතුරු 02යි.

**රැකියා කොන්ත්‍රාත්තුවේ නියමයන්**

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් මාස හයක කාලයක් සඳහා කෙටි කාලීන රැකියා කොන්ත්‍රාත්තුවක් ලබා දෙනු ඇත.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතාවය මත

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

ඉහත එක් එක් තනතුර පිළිබඳව වැඩිදුර විස්තර, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයෙහි වෙබ් අඩවිය වන **https://mode.gov.lk** වෙත පිවිසීමෙන් ලබාගත හැක. මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට තමන්ගේ ජීව දත්ත තොරතුරු පත්‍රය සමග ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ සම්බන්ධතා විස්තර 2025 අප්‍රේල් 07 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **secretary@mode.gov.lk** වෙත හෝ තැපැල් මගින් ලේකම්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, 11 වන මහල, ඒකක අංක : 1101, වන් ගෝල් ෆේස් ටවර්, අංක 1A, මැද පාර, කොළඹ - 02 වෙත යොමු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. අයදුම් කරනු ලබන තනතුර විද්‍යුත් ලිපියෙහි ශීර්ෂය තිරුවෙහි සහ ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.


ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, 11 වන මහල,

**ඒකක අංක : 1101, වන් ගෝල් ෆේස් ටවර්, අංක 1A, මැද පාර, කොළඹ 02.**
**දුරකථන : 94 112 334575, ෆැක්ස් : +94 112 334576**
**වෙබ් අඩවිය : https://mode.gov.lk**